# අකුසලකර්මය හා අපායභූමිය පිළිබඳ අභිලේඛන ශාපපාඨ ඇසුරින් අධ්‍යයනයක් (ක්‍රි.ව. 8 - 15 සියවස්වලට අයත් අභිලේඛන ආශ්‍රයෙන්)

එල්. තිලිනි තරුෂි ද සිල්වා[1] එල්. ඩිල්ෂානි ඉෂන්ති ද සිල්වා[2]

## හැඳින්වීම

මරණය, මරණින් මතු උපත හා භවචක්‍රය පිළිබඳ ව වඩා තර්කානුකූල හා විද්‍යානුකූල අදහස්, සංකල්ප හා මතවාද ඉදිරිපත් කර ඇති ආගමික දර්ශනයන් අතුරින් බෞද්ධ දර්ශනයට ප්‍රමුඛස්ථානයක් හිමි වන බව අවිවාදාත්මක කරුණකි. මරණින් මතු පැවැත්ම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම කුසලා'කුසලකර්ම පදනම් කරගත් අතිශය සංකීර්ණ කරුණු රාශියකින් සංගෘහීත වේ. කායිකව හෝ මානසික ව හෝ වාචසික ව යම් ක්‍රියාවක් කරන කල්හි ඇති වන චිත්ත චෛතසිකයන් 'කර්මය' යනුවෙන් හඳුන්වනු ලැබේ. යම් අරමුණක සිත පිහිටීමෙන් උපදිනා ලෝභ, ද්වේෂ, මෝහ, අලෝභ, අද්වේෂ, අමෝහ යන හේතු සයේ උපකාරයෙන් පහළ වන චේතනාවන් හේතුවෙන් චෛතසිකයන් උපදින අතර, එලෙස උපදින චෛතසික 'කර්මය' යනුවෙන් තවදුරටත් විග්‍රහ කළ හැකි ය. කර්මය විපාක දෙන ස්ථානය යන නිර්ණායකයට අනුව අරූපාවචරභූමිය, රූපාවචරභූමිය, කාමසුගතිභූමිය සහ අපායභූමිය යන චතුර්විධ භූමින්ට අයත් ලෝක තිස් එකක සත්ත්වයා උපත ලබන බැව් බෞද්ධ දර්ශනයේ දී සාකච්ඡා කෙරෙන අතර, ඉන් නිරය, අසුරනිකාය, ප්‍රේතලෝකය සහ තිරශ්චීනයෝනිය ලෙස අපායභූමි වර්ග කොට දක්වයි.

රාජ්‍ය නීතිරීති සහ වත්පිළිවෙත් කඩ කරන්නන් මෙන් ම සාංඝික දේපළ අවභාවිත හා විනාශයට පත් කරන්නන් හට එය අකුසලකර්මයක් බවත් ඉන් දුගතියට පත්වන බවත් ඒත්තු ගන්වමින් ඉඳුරා ම මෛත්‍රීසහගත සිතිවිලිවලට විරුද්ධ අනාගත ආත්මභාවය පිළිබඳ බියක් සන්ත්‍රාසයක් උපද්දවා නීතියට අවනත කර ගැනීම සඳහා ඇතැම් අභිලේඛනයක අවසාන පේළි කිහිපය තුළ යොදනු ලැබූ පාඨයන් **'ශාපපාඨ'** ලෙස සරලව අර්ථකථනය කළ හැකි ය. මරණින් මතු ආත්මභාවයන්හි දුක්ඛදායී පාරලෞකික උප්පත්තිය ගැන සඳහන් කෙරෙන අභිලේඛන ශාපපාඨයන් අතර අපායභූමියට අයත් නිරය, ප්‍රේතලෝකය හා තිරශ්චීනයෝනියන්හි උප්පත්තිය පිළිබඳ සඳහන් කෙරෙන ශිලාලේඛන පමණක් මෙම අධ්‍යයනය සඳහා සීමා කර ගැනුණි.

රාජ්‍යත්වය පිළිබඳ ගැටලුකාරීමය තත්ත්වයන් පැන නැඟුණු අවස්ථාවල දී දඬුවම් කර නීතියට අවනත කර ගැනීමට යෑමෙන් ජනතා අප්‍රසාදයට පත් වෙතැයි යන හැඟීමෙන් බොහෝමයක් නරපතීහු අභිලේඛනයන්හි ශාපපාඨ දක්වා තම පාලනතන්ත්‍රය විධිමත් ව මෙන් ම සාමකාමී ව පවත්වාගෙන යෑමට කටයුතු කළහ. තව ද සාංඝික දේපළ අවභාවිත හා විනාශ කරන්නන්ට එරෙහි ව දඬුවම් පමුණුවීමට භික්ෂූන් වහන්සේලා අධිකරණ කටයුතු හා නෛතික කටයුතුවලට යෑමට දැක්වූ මැලිකම ද නරපතීන් ශිලාලේඛනයන්හි ශාපපාඨයන් එක්කරවීමට තවත් එක් ප්‍රධාන හේතුවක් විය. මෙබඳු සංකල්පයන් බුද්ධභාෂිතයට ඉඳුරා ම වෙනස් වුව ද බුද්ධශාසනයේ පැවැත්මට බලවත් හානි සිදු

[1]. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. *lttharushi92@gmail.com*

[2]. රජරට විශ්වවිද්‍යාලය.

කෙරෙන අවස්ථාවල දී එකී අවස්ථාවන් මඟ හරවා ගෙන ආරක්ෂා කර ගැනීමේ අරමුණ පෙරදැරි ව ශිලාලේඛනයන්හි ශාපපාඨ අන්තර්ගත කරන ලදී. මෙම අභිලේඛන ශාපපාඨ හරහා අවධාරිත ශාප කිරීම නීති හා වත්පිළිවෙත් කඩ කරන්නන්ට සත්‍ය වශයෙන් සිදු වන බව ඒත්තු ගැන්වීමට තරම් ප්‍රබල ය.

**පර්යේෂණ අරමුණු**

යථෝක්ත කාල පරාසයට අයත් අභිලේඛන ශාපපාඨයන්හි අන්තර්ගත අපායභූමි, එම ආත්මභාවයන්හි උප්පත්තිය ලැබීම සඳහා හේතුවන බවට දක්වන ලද අකුසලකර්මයන් හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙහි මුඛ්‍ය අරමුණ වූ අතර, බෞද්ධ දර්ශනයේ කර්මය, පුනර්භවය හා භවචක්‍රය වැනි සංකල්පයන්ගෙන් පෝෂණය වූ රාජ්‍ය පාලනතන්ත්‍රයේ බෞද්ධ මුහුණුවර හඳුනා ගැනීම හා රාජ්‍ය සන්නිවේදනය උදෙසා අභිලේඛනයන්හි දායකත්වය ආදිය අනාවරණය කර ගැනීම මෙහි අනු අරමුණු වශයෙන් දැක්විය හැකි ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

Epigraphia Zeylanica පළමු, දෙවන, තෙවන හා සිවුවන කාණ්ඩ මෙහි ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් යොදා ගත් අතර, මෙම පර්යේෂණ මාතෘකාවට අදාළව විෂය ප්‍රාමාණික උගතුන් විසින් ලියා ඇති පොත්පත්, පර්යේෂණ ලිපි, පුවත්පත් ලිපි හා සඟරා ආදිය තුළින් ලබාගත් තොරතුරු ද විද්‍යුත් මාධ්‍යය තුළින් ලබාගත් තොරතුරු ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් උපයෝගී කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා පාඨ විශ්ලේෂණය හා සන්දර්භ විශ්ලේෂණය යන ක්‍රමවේදය භාවිතයට ගැනිණ.

**පර්යේෂණ ගැටලුව**

ක්‍රි.ව. 8 සියවසේ සිට 15 සියවස දක්වා ලියැවී ඇති අභිලේඛනමය මූලාශ්‍රයන්හි දක්නට ලැබෙන ශාපපාඨ මඟින් නිරූපිත අකුසලකර්මය අපායභූමිවල (නිරය, අසුරනිකාය, ප්‍රේතලෝකය හා තිරශ්චීනයෝනිය) උප්පත්තියට හේතු වන බව බුදුදහමින් සලකනු ලැබේ ද? යන්න සොයා බැලීම පර්යේෂණයේ ගැටලුව යි.

**පර්යේෂණ සාකච්ඡාව හා පර්යේෂණ සමාලෝචනය**

බුදුදහම හා අතීත රාජ්‍ය පාලන ක්‍රමය තදාත්මීය ව බැඳී පැවති බව රාජ්‍ය පාලනයේ දී ත් රාජ්‍ය නීති පැනවීමේ දී ත් නීති කඩ කරන්නන්ට දඬුවම් පමුණුවීමේ දී ත් බෞද්ධ දර්ශනය මත පදනම් ව කටයුතු කළ බව ප්‍රත්‍යක්ෂ කරගත හැකි එක් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස අභිලේඛන ශාපපාඨ දැක්විය හැකි ය. බෞද්ධ දර්ශනයෙන් ලද අභිප්‍රේරණයෙන් දැහැමි රාජ්‍ය පාලනයක නිරත වූ අතීත පාලකයෝ සිය පාලනතන්ත්‍රය විධිමත් ව පවත්වා ගැනීමේ උපක්‍රමයක් ලෙස දඬුවම් ක්‍රමයක් වෙනුවට අනාගත ආත්මභාවය අපායභූමියක උපත ලබන බව දක්වන ශාපපාඨයන් අභිලේඛනයන්හි දැක්වූහ.

රාජ්‍ය නීතිරීති සහ වත්පිළිවෙත් කඩ කරන්නන් හා සාංඝික දේපළ අවභාවිත කරන්නන් ජනසමාජය තුළ ඉතා ම පහත් යැයි සම්මත තිරශ්චීන ආත්මභාවයන් සේ සැලකෙන බල්ලන්, කපුටන්, කැනහිලුන් වැනි ආත්මභාවයන්හි ඉපදීම සිදු වන බව යථෝක්ත කාල සීමාවට අයත් කිරිගල්ලෑව ටැම්ලිපිය, නෑගම ටැම්ලිපිය, මැදිරිගිරිය ටැම්ලිපිය, මොරගොඩ ලිපිය, බිලිවැව ටැම්ලිපිය, බතලගොඩ ශිලාලිපිය, නාරං

බැද්ද ලිපිය, සහස්‍රමල්ලගේ පුවරුලිපිය, කටගමුව පුවරුලිපිය, අලුත් වැව ටැම්ලිපිය, කොට්ටන්ගේ ගිරිලිපිය, මැදිරිගිරිය පුවරුලිපිය, රඹෑව ලිපිය, ගංගාරාම ලිපිය, ගැරඬිගල ලිපිය ආදී සෙල්ලිපිවල ඇති ශාපපාඨයන්හි දැක්වේ. එමෙන් ම දෙවන ලෝකේශ්වර රජ දවස ලියැවී ඇති කොට්ටන්ගේ ගිරිලිපියේ ශාපපාඨයෙන් සාඞ්ඝික දේපළ අවභාවිත කරන්නන් බලු කපුටු වැනි ආත්මභාවයන්හි ඉපදීමක් සිදු වන බවට අමතර ව අටමහනිරයේ (සංජීවය, කාලසූත්‍රය, සඞ්ඝාතය, රෞරවය, මහාරෞරවය, තාපය, මහා තාපය, අවීචිය යන අපාය අට) ඉපදීමක් ගැන ද සඳහන් කෙරේ. තව ද ඔරුවල සන්නස් ශාපපාඨයෙන් අටමහ නිරයට අමතර ව ප්‍රේතලෝකයේ උප්පත්තිය පිළිබඳ සඳහනක් දැකගත හැකි අතර ම සැලව ශිලාලිපියේ බුද්ධභෝගයන් සොරකමෙහි යෙදෙන්නන් ප්‍රේත ව උප්පත්තිය ලබන බවට දක්වා ඇත. මෙලෙස රාජ්‍ය පාලනයේ ආගමික මුහුණුවරක් එක් කොට ඇති ශාපපාඨ හරහා විශද කරනුයේ අකුසලකර්මයන් දුගතියට පත්වීමට හේතුවන බව දක්වන බෞද්ධ දර්ශනයේ එන මුඛ්‍ය අන්තර්ගතය කෙරෙහි ජනයාගේ අවධානය, රාජ්‍ය අඥා සන්නිවේදනයට අනුව යොමු කිරීම යි.

**ප්‍රමුඛ පදඃ** අභිලේඛන, ශාපපාඨ අපායභූමි, තිරශ්චීන ආත්මභාවය, බෞද්ධ දර්ශනය

**මූලාශ්‍රය**


- Wickremasinghe, Don Martino De Zilva (ed.). (1985). **Epigraphia Zeylanica Vol-ii.** London: Oxford University press.
- Paranavitana, S. (ed.). (1980). **Epigraphia Zeylanica Vol iii.** London: Oxford University press.
- Paranavitana, S. (ed.). (1943). **EpigraphiaZeylanica Vol. iv.** London: Oxford University press.
- Paranavitana, S. (ed.). (1955). **Epigraphia Zeylanica Vol. v'** Colombo: Department of Archaeology.
- කුමාර, ආනන්‍දතිස්ස (1990). **පැරණි ලක්දිව අත්තාණි ප්‍රදාන විධි.** කැලණියඃ විද්‍යාලඞ්කාර මුද්‍රණාලය.
- කුලතුංග, ටි.ජී. (1996). **අභිලේඛන ශාපපාඨ.** මහරගමඃ තරංජී ප්‍රින්ටර්ස්.
- ගුණවර්ධන, ආර්.ඒ.එල්.එච්. (1996). **සිවුර සහ නගුල.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ සමාගම.
- තිලකරත්න, ඒ.කේ. (2009). **පුනර්භවයේ මූලික සිද්ධාන්ත.** අනුරාධපුරයඃ නිමාලි මුද්‍රණාලය.
- රෝහණධීර, මැන්දිස් (1998). **නිශ්ශඞ්කමල්ල.** මහරගමඃ තරංජී මුද්‍රණාලය.
- සෙනෙවිරත්න, ඊෂාන් (2000). **ජීවිතය මරණය සහ මරණින් මතු ජීවිතය.** කොළඹ 11ඃ වන්නි ප්‍රකාශන
- සෝරත හිමි, අලුත්වැව (2011). **මානසික ශික්ෂණය උදෙසා බෞද්ධ භාවනාව සහ වෙනත් ලිපි.** නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.